# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
# MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: NPD/DCB/2024/GEN
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.05. 15

මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ: MF/02/2023 – (ii)

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**<u>විමධ්‍යගත අයවැය වැඩසටහන 2024</u>**

2023.12.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 23/විවිධ/(070) අනුව පිහිටුවනු ලැබූ "ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් වේගවත් කිරීමේ හා අධීක්ෂණය කිරීමේ කමිටුව" ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2024.05.08 වන දින පාර්ලිමේන්තු පරිශ්‍රයේදී රැස්වන ලදී.

02. ඒ අනුව උක්ත රැස්වීමේදී විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 අදාළව පහත තීරණවලට එළැඹි බවත් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

2.1 විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 සම්බන්ධයෙන් 2024.04.30 දිනැතිව නිකුත් කරනු ලැබූ සංශෝධිත චක්‍රලේඛ MF/02/2023 – (i) හි අංක 02 යටතේ දක්වා ඇති ව්‍යාපෘති සංශෝධනය කිරීම එම සංශෝධිත චක්‍රලේඛයේ සඳහන් කොන්දේසිවලට යටත්ව ව්‍යාපෘති ද්විකරණය වීම වලකමින් 2024.05.31 දින දක්වා දීර්ඝ කිරීමට තීරණය විය.

2.2 විමධ්‍යගත අරමුදල් මගින් රජයේ ලියාපදිංචි පෞද්ගලික පෙර පාසල් සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය සහය ලබා දීමට තීරණය විය. එම කාර්යය ප්‍රාදේශීය ලේකම්ගේ සෘජු අධීක්ෂණය හා මඟ පෙන්වීම යටතේ සිදු කිරීමටත්, ලබා දෙන පහසුකම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොග ලේඛනයට ඇතුලත් කළ යුතු බවටත්, යම් හෙයකින් පහසුකම් ලබා දීමෙන් අනතුරුව එම පෙර පාසල් ක්‍රියාත්මක නොවන්නේ නම් ලබා දුන් පහසුකම් ප්‍රාදේශීය ලේකම් විසින් පවරාගෙන වෙනත් සුදුසු පෙර පාසලක් වෙත එය ලබා දීමට ක්‍රියා කළ යුතු බවටත් තීරණය විය.

2.3 තරුණ තරුණියන් සඳහා සුදුසු වෘත්තීය පුහුණු පවත්වන රජයේ හා ලියාපදිංචි ආයතන මගින් විධිමත් හා සුදුසු පුහුණු වැඩසටහන් පැවැත්වීම හා පිළිගත හැකි මට්ටමේ වෘත්තීය

පුහුණු සහතික ලබා දීම සඳහාත් විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 මගින් ප්‍රතිපාදන ලබා දීම සුදුසු යැයි තීරණය විය.

2.4 විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 චක්‍රලේඛයේ 2.7 සංවර්ධන අංශය යටතේ ජාතික පාසල් සම්බන්ධ සංවර්ධන යෝජනා සඳහා ද අනෙකුත් අරමුදල් ප්‍රභවයන්ගෙන් ලැබෙන සම්පත් සමඟ ද්විකරණය නොවන පරිදි විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 මගින් ප්‍රතිපාදන සැලසීමට ද තීරණය විය.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
ලේකම්

පිටපත් -

| | |
|---|---|
| 1. ගරු පළාත් ආණ්ඩුකාරවරු | - කාරුණික දැනගැනීම පිණිස |
| 2. සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු | - කාරුණික දැනගැනීම පිණිස |
| 3. ජනාධිපති ලේකම් | - කාරුණික දැනගැනීම පිණිස |
| 4. අග්‍රාමාත්‍ය ලේකම් | - කාරුණික දැනගැනීම පිණිස |
| 5. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් | - කාරුණික දැනගැනීම පිණිස |
| 6. විගණකාධිපති- විගණකාධිපති දෙපාර්තමේන්තුව | - කාරුණික දැනගැනීම පිණිස |
| 7. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කාරුණික දැනගැනීම පිණිස |
| 8. ලේකම්, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 9. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 10. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 11. අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 12. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 13. අධ්‍යක්ෂ ජනරාල් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 14. සියලුම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරුන් | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 15. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |